චක්‍රලේඛ අංකය :- 1995/09

මගේ අංකය: 2/ජාපා/2/304
1995 මැයි මස 15 දින
බත්තරමුල්ල, "ඉසුරුපාය"
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන
අමාත්‍යාංශයේ ජාතික පාසැල් ඒකකයේදී ය.

සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පාසල් ප්‍රධානීන් වෙත,
(රජයේ, පෞද්ගලික හා අනුමත පාසල්වල)

## පාසල්වලට ළමුන් ඇතුළත් කිරීම - 1996 හා ඉන්පසු

1 පාසල් වලට ළමුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති සියළුම චක්‍රලේඛ අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 1996.01.01 හා ඉන් පසුව පාසල් වලට ළමුන් ඇතුළත් කිරීමේ දී වලංගු වනු ඇත.

2 පළමු වසර පංතිවලට ළමුන් ඇතුළත් කිරීම.

2.1 ළමුන් ඇතුළු කිරීම සඳහා සුදුසුකම්

2.1.1 ළමයා ඇතුළු කරන වර්ෂයේ ජනවාරි මාසයේ 31 දිනට අවම වයස අවුරුදු පහක් විය යුතුය. මේ සඳහා උප්පැන්න සහතිකය ඉදිරිපත් කළ යුතුය. උප්පැන්න සහතිකයේ පිටපතක් ලබා ගන්නා තුරු බී-34 ආකෘතියේ නිකුත් කර ඇති උපත් ලේඛණයේ උද්ධෘතයක් තාවකාලිකව පිළිගත හැකිය.

2.1.2 ජනවාරි 31 දිනට වයස අවුරුදු 6 ට වැඩි ළමුන් ඇතුළත් කළ හැක්කේ වයස අවුරුදු 6 ට අඩු සුදුසුකම් ඇති ළමුන් සියලු දෙනාම ඇතුළත් කර ගැනීමෙන් පසුව ය.

2.1.3 මව්පියන් පදිංචිව සිටින්නේ එකම ස්ථානයක නොවන කල්හි ඔවුන් නීතියෙන් වෙන් නොවූ අය නම් පියා පදිංචි ස්ථානය ළමයා පදිංචි ස්ථානය වශයෙන් සළකනු ලැබේ.

2.1.4 ළමයකු පළමු වසර පංතියට ඇතුළත් කිරීමේ දී නීත්‍යානුකූලව පත් කරනු ලැබූ පුද්ගලයෙකු පමණක් භාරකරු වශයෙන් පිළිගනු ලැබේ.

2.1.5 රජයේ, පෞද්ගලික හෝ අනුමත පාසලකට ඒ වන විට ඇතුළත් කර ඇති ළමයකු පළමු වසර සඳහා ඇතුලත් කිරීමට සුදුසු නොවන්නේ ය.

3 ළමුන් ඇතුළත් කිරීමේ කාර්ය පටිපාටිය

3.1 සෑම වර්ගයකම මැයි මාසයේ දී ඊළඟ වසර, පළමු වසර පන්තියට ළමුන් ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන මාපියන්ගෙන් හෝ නීත්‍යානුකූල භාරකරුවන්ගෙන් අයදුම්පත් කැඳවන දැන්වීම රජයේ ගැසට් පත්‍රයේ හා ප්‍රවෘත්ති පත්‍රවල පළකරනු ලබනවා ඇත.

3.2 මා පියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන් තමන්ගේ ස්ථිර පදිංචි ස්ථානයට ආසන්නතම පාසලේ ප්‍රධානියා වෙත ජුනි 30 දින හෝ ඊට පෙර ලැබෙන සේ අයදුම්පත් ලියාපදිං

තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය. අතින් භාර දෙන්නේ නම් භාරගත් බවට ලදු පතක් ලබා ගත යුතුය. තම දරුවාගේ සහෝදර/සහෝදරියන් ද දැනටමත් ඉගෙන ගන්නා පාසලකට හෝ තමන් ආදි ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක වන පාසලකට හෝ ළමයා ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් එම පාසලටද අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි ය.

3.3 අයදුම්පත ඉදිරිපත් කළ යුත්තේ ගැසට් පත්‍රයේ සහ ප්‍රවෘත්ති පත්‍ර වල ද පළ කරනු ලබන මෙම චක්‍රලේඛයට අමුණා ඇති නියමිත ආකෘති පත්‍රය අනුවය.

4 තෝරා ගැනීමේ කාර්ය පටිපාටිය

4.1 නියමිත දිනට ලැබු අයදුම්පත් සංඛ්‍යාව පාසලේ ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වඩා ඇතුළත් කළ යුතු ප්‍රමාණයකින් වැඩි වන්නේ නම්, ඇතුළත් කර ගැනීමට සුදුසු සිසුන් තෝරා ගැනීම සඳහා පාසැල් ප්‍රධානියා විසින් සිසුන් ඇතුළත් කිරීමේ කමිටුවක් ස්ථාපනය කළ යුතු වන්නේය. මෙම කමිටුවේ ප්‍රධානියා පාසැල් ප්‍රධානියා හෝ නියෝජ්‍ය විදුහල්පතිවරයා විය යුතු අතර, ප්‍රාථමික අංශයේ ප්‍රධානියා ද තවත් ජ්‍යෙෂ්ඨ ගුරුවරයෙක්/ගුරුවරියක් හා පාසැල් සංවර්ධන සමිතියේ /නියෝජිතයෙක් ද ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජිතයෙක් ද මෙම මණ්ඩලයට ඇතුළත් විය යුතු ය.

4.2 ඇතුළත් කිරීමේ කමිටු රැස්වීම් කටයුතු ප්‍රසිද්ධියේ පැවැත්විය යුතු ය.

5 යම් පාසලකට පළමු වසර පංතියේ පවත්නා පුරප්පාඩු පහත දක්වෙන ප්‍රතිශත වලට අනුව පහත දක්වෙන ගණයන්ට අයත් ළමුන් අතරින් පුරවනු ලැබිය යුතුය.

5.1 ගෘහ මූලිකයින්ගේ දරුවන් - 40%

මේ ගණය සඳහා ළමයින් තෝරා ගැනීමේ පදනම වනුයේ,

(අ) මාපියන්ගේ ස්ථිර වාසස්ථානයේ සිට ළමයින් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කරන ලද පාසලට ඇති ආසන්නතාව (ආසන්නතාවය ගණනය කළ යුත්තේ පාසලේ පරිශ්‍ර සීමාවේ සිටය)

(ආ) ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබූ වසර ජනවාරි 1 වන දින වන විට අඛණ්ඩ පිරිසෙන් අවුරුදු 3 ක වත් ස්ථිර අඛණ්ඩ පදිංචිය තහවුරු වීමය. මෙහිදී වැඩි කාලයක් පදිංචිය ඇති අයට ප්‍රමුඛතාවයක් ලැබෙන සේ පහත දක්වෙන ලකුණු ක්‍රමයක් අනුගමනය කරනු ඇත.

| | |
|---|---|
| පදිංචිය අවුරුදු 3 නම් ලකුණු | 01 |
| අවු. 3 ට වැඩි 5 ට අඩු ලකුණු | 03 |
| අවු. 5 ට වැඩි 10 ට අඩු ලකුණු | 05 |
| අවු 10 ට වැඩි | 07 |

(උපරිමය ලකුණු - 07)

(ඇ) ආවාහ විවාහ වීමෙන් පසුත් ස්වයංක්‍රීය මාපියන්ගේ නිවසක ස්ථිරවම පදිංචි වී සිටින පුද්ගලයින් පාසලකට ළමුන් ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක්

5.1 ආ. උප වගන්තියේ සඳහන් අඛණ්ඩ කාල සීමාව තුළ මාපියන්ගේ නිවසේ ඇත්ත වශයෙන් ම වාසය කළ බව ලිපි ලේඛන වලින් පෙනී යන්නේ නම් ඔවුන් ගෘහ මූලික ගණයේ ලා සලකා බලනු ලැබිය හැකිය.

(මා පියන්ගෙන් වෙන්වී වසන දරුවන්ගේ දරුවන් මෙයට අදාල නොවේ.)

5.2 ගෘහ මූලික නොවන තැනැත්තන්ගේ දරුවන් - 07%

මේ ගණයේ ළමුන් තෝරා ගැනීමේ පදනම වනුයේ,

(අ) ළමුන් ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කරන ලද පාසලට ඔවුන්ගේ මාපියන්ගේ ස්ථිර වාසස්ථානයේ ආසන්නතාව සහ

(ආ) ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබූ වසරේ ජනවාරි මස 01 වන දින වන විට යටත් පිරිසෙයින් අවුරුදු 3 ක් වත් අඛණ්ඩ පදිංචිය තහවුරු වීමය.

5.3 මාරුවීම් ලැබ පාසල පිහිටි ප්‍රදේශයේ වාසය කිරීම සඳහා පැමිණි රජයේ නිලධරයන්ගේ දරුවන් හා රජකාරී කටයුතු නිසා තම පෞද්ගලික වාසස්ථානයෙන් බැහැරව වාසය කිරීමට සිදුවන, පාර්ලිමේන්තුවට, පළාත් සභාවලට හා ප්‍රාදේශීය සභාවලට තේරී ඇති නියෝජිතයන්ගේ දරුවන් - 8%

මේ ගණයේ ළමුන් තෝරා ගැනීමේ පදනම වනුයේ, යම් රජයේ නිලධාරියෙකුගේ/සංස්ථා සේවකයෙකුගේ/බැංකු නිලධාරියෙකුගේ ඉල්ලීම මත නොව, ආණ්ඩුවේ/ආයතනයේ අවශ්‍යතාවය මත පාසල පිහිටි ප්‍රදේශයට මාරුවීම් ලැබ පැමිණෙන රජයේ නිලධාරින්/සංස්ථා සේවකයින්/බැංකු නිලධාරින්ගේ ළමුන් සම්බන්ධයෙන් පමණක් අදාල විය යුතුය. සථාන මාරුවීම් ළමුන් ඇතුළත් කිරීමේ වර්ෂයේ ජනවාරි 01 වෙනි දිනට පෙරාතුවම වූ වර්ෂ 3 ඇතුළත සිදු වී තිබිය යුතුය.

තෝරා ගැනීමේ පදනම වන්නේ මාපියන්ගේ වාසස්ථානයේ සිට ළමුන් ඇතුළත් කිරීම සඳහා පාසලට ඇති ආසන්නතාවයයි.

5.4 එවකටත් තත් පාසැලේ අධ්‍යාපනය ලබන සිසුන්/සිසුවියන්ගේ සහෝදර/සහෝදරියන් 20%
මේ ගණයේ ළමුන් තෝරා ගැනීමේ පදනම වනුයේ ළමුන්ගේ මා පියන්ගේ ස්ථිර වාසස්ථානය සහ ආසන්නතාවය පිළිබඳ නියමය ප්‍රධාන කොට සළකා ඒ මාපියන්ගේ වැඩි මහල් ළමයින් දැනටමත් ඒ පාසැලේ ඉගෙනීම ලබමින් සිටීමය.

5.5 තත් පාසලේ ආදී සිසු/සිසුවියන් වන මාපියන්ගේ දරුවන් - 25%
මෙම ගණයේ ළමයින් තෝරා ගැනීමේ පදනම වනුයේ

(1) ඒ ළමුන්ගේ මා පියන් ඒ පාසැලේ ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් වීමය. (මෙම චක්‍රලේඛයේ අංක 1 උපලේඛනයක් වශයෙන් දක්වෙන නිර්නායකයන් මෙම ගණයේ ළමුන් තෝරා ගැනීම සඳහා උපයෝගී කරගත හැකිය.)

6 උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියෙහි යෙදී සිටින ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ සේවකයින්ගේ දරුවන්ට දී ඇති විශේෂ අනුග්‍රහය

(අ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශයත් අතර ඇති කරගත් එකඟතාවයක් මත දෙනු ලබන මෙම අනුග්‍රහය ලබා දීම ක්‍රියාත්මක වන්නේ රේඛීය අමාත්‍යාංශයේ ජාතික පාසැල් අංශයේත් මැදිහත් වීමෙනි.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශය විසින් අදාල බලධාරින්ගේ අත්සනින් යුතුව, මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලබන, අයදුම්පත් සළකා බලා, එක් පාසැලකට සාධාරණ ශිෂ්‍ය සංඛ්‍යාවක් බෙදී යන සේ ඒ සඳහා පිළියෙල කරන ලද විශේෂ ආකෘතියක් මගින් එවනු ඇත. එම ළමුන් අනිවාර්යෙන්ම ඇතුළත් කරනු ලැබිය යුතුය.

(ඇ) මේ පිළිබඳ සියලු විධිවිධානයන්, රේඛීය අමාත්‍යාංශය මගින් පමණක් පාසල්වලට දන්වනු ලබන අතර වෙනත් බලධාරියෙකුට එවැන්නක් ඉදිරිපත් කිරීමට බලයක් නැති බව සැලකිය යුතුය.

(ඈ) මෙම දරුවන් 5.1 සිට 5.5 දක්වා ඡේදවලට සඳහන් දරුවන් සංඛ්‍යාවට අමතරව බව සැලකිය යුතුය.

(ඉ) මෙම අනුග්‍රහය තාවකාලික එකක් වන අතර මෙම අමාත්‍යාංශයේ ලේකම් විසින්, [illegible] සිටි අවස්ථාවක එය අත්හිටුවිය හැකිය.

## 7 අයදුම්පත් ලැබීමෙන් පසු ක්‍රියා පිළිවෙල

7.1 ඉල්ලුම්පත් එවිය යුතු අවසාන දිනයෙන් පසුව, සියළුම අයදුම්පත් විදුහල්පතිවරයාගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ පැහැදිලි ලෙස ඉහත 5.1, 5.5 දක්වා වූ ගණයන් අනුව වර්ගීකරණය කළ යුතුය.

7.2 එසේ වර්ගීකරණය කරන ලද අයදුම්පත් අංක කොට සී. ආර්. පොතක ඒ ඒ ගණයන් වෙන් කරන ලද පිටුවල අනු අංකය සහිතව, ලේඛණාරූඪ කළ යුතුය. මේ සඳහා පොතෙහි එකයාවට පිහිටි පිටු දෙකක් සම්බන්ධ වනසේ යොදා ගත හැකි වන අයුරු පහත සඳහන් ආකෘතිය ඒ සඳහා භාවිතා කළ යුතුය.

ගණය :-..................................................

| අනු අංකය | ළමයාගේ නම | උපන් දිනය | ස්ත්‍රී/පුරුෂ භාවය | මාපියා/භාරකරු ගේ නම | ලිපිනය | ඉදිරිපත් කරනු ලබන ලියවිලි | | | | | | | | | විශේෂ ප්‍රකාශ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | |

## 8 තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය

8.1 ප්‍රථම සම්මුඛ පරීක්ෂණය

අයදුම්පත් ලැබී ලේඛණගත කිරීමෙන් පසුව ස්ථාපිත කරන ලද සම්මුඛ පරීක්ෂණ කමිටුව විසින් අදාල මාපියන්/භාරකරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබිය යුතුය. කැඳවීම් ලිපි පාසල් ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව සති දෙකකට වත් කලින් අදාල මව/පියා/නීත්‍යානුකූල භාරකරුට ලැබෙන සේ තැපෑලෙන් යැවිය යුතුය. එසේම සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දින පිළිබඳව කල් ඇතිව උදෑසන රැස්වීමේදී ප්‍රකාශ කිරීමෙන් හා දන්වීම් පුවරුවේ යෙදීමෙන් ප්‍රසිද්ධ කළ යුතුය.

8.2 ළමුන් ඇතුළත් කිරීම සඳහා තම හිමිකම් පෑම සනාථ කිරීමට මාපිය, නීත්‍යානුකූල භාරකරුවන් විසින් පහත දක්වෙන ලේඛණ ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(අ) ඇතුළත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්වල සඳහන් මාපියන්ගේ ස්ථිර වාසස්ථාන පිළිබඳ හිමිකම් ඔප්පු

(ආ) ඒ ස්ථාන සම්බන්ධයෙන් පළාත් ආයතනය විසින් නිකුත් කරන ලද තක්සේරු/දන්වීම්, ගෙවීම් ලදුපත්

(ඇ) ඒ ස්ථානයට අදාල ගෙවල් කුලී ලදුපත්, විදුලි බිල්පත් හා ජල බිල්පත්

(ඈ) ජාතික හැඳුනුම්පත හෝ මාපියන්ගේ වෙනයම් හැඳුනුම් ලේඛණයක්

(ඉ) මැතිවරණ ලැයිස්තුවේ උපුටන

(ඊ) ගෘහ මූලික ලැයිස්තු උපුටන

(උ) වෙනත් යම් යම් පිළිගත හැකි ලේඛණ

8.3

(අ) තමා විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛණවල නිරවද්‍යතාවය, දිව්රුම් පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් සහතික කළ යුතුය.

(ආ) එසේ වුවද, ඉදිරිපත් කරන ලද යම් ලේඛණයක් කූට ලේඛණයක් යයි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැඟී යන්නේ නම්, එය නිකුත් කර ඇති ආයතනයෙන් හෝ බලධාරියාගෙන් විමසීමක් කොට එහි සත්‍ය අසත්‍යතාවය තහවුරු කර ගැනීමට මණ්ඩලයේ සභාපති වශයෙන් පාසැලේ ප්‍රධානියාට බලයක් ඇත. එවැනි අවස්ථා ඇති වූ කල්හි ඒ පිළිබඳ අදාළ බලධාරියාට සුදුසු පරිදි කටයුතු කිරීමට දන්වා සිටිය හැකිය.

(ඇ) මෙසේ ඉදිරිපත් කරනු ලබන ලේඛණ 7.2 හි සඳහන් පිළියෙල කරන ලේඛණයේ ළමයාගේ නමට ඉදිරියේ ඇති (ඒ ඒ ශීර්ෂය යටතේ) තීරුවෙහි √ (හරි) ලකුණින් (නිල් හෝ කළු පෑනකින්) ලකුණු කළ යුතුය.

(ඈ) ජාතික පාසැල් වලදී මෙසේ ඉදිරිපත් කරනු ලබන ලේඛණවල ඡායා පිටපත් ඒ ඒ ළමයාට වෙන් කරනු ලබන ගොනුවකට ගොනු කොට තබා ගත යුතුය.

8.4 ඉදිරිපත් කර ඇති ලේඛණවල වලංගුතාවය නිසැකවම දන, මාපියන්/නීත්‍යානුකූල භාරකරුවන් විසින් කරන ලද වැඩිපුර හිමිකම් පෑම සත්‍ය බව ඔප්පු කිරීමෙන් පසු, ඒ ළමුන් අයත් "ගණ" යටතේ සකස් කරන ලද,

(අ) පාසැලට ඇතුළත් කිරීම සඳහා තෝරා ගන්නා ලද, ළමුන්ගේ තාවකාලික ලැයිස්තුවක් පිළියෙල කරනු ලැබිය යුතුය.

(ආ) තාවකාලික ලැයිස්තුවට ඇතුළත් විය යුත්තේ සමාන්තර පංතියකට ළමුන් 35 බැගිනි. අභියාචනා වලින් ගැනීමට අඩුරතු 5 බැගින් ඉඩ තැබිය යුතුය. සමාන්තර පංතියක මුළු ගණන 40 කි. (6 ඡේදයේ සඳහන් ළමුන් හැර)

(ඇ) යම් දරුවෙක් 5.1 - 5.5 දක්ව ඇති ගණ එකකට වඩා වැඩි ගණනකට අයත්වන කල්හි ඒ අයට වැඩි ප්‍රමුඛතාවයක් දිය යුතුය.

(ඈ) තාවකාලික ලැයිස්තුව පහත දක්වා ඇති ආකෘතියට සරානුකූල විය යුතුය.

ගණය/වර්ගය ..............................

| අනුක්‍රමික අංකය | ළමයාගේ නම | පියාගේ/මවගේ/හෝ නීත්‍යානුකූල භාරකරුගේ නම | ලිපිනය |
|---|---|---|---|
| | | | |

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නම අත්සන

1

2

3

(ඉ) ඉහත සඳහන් පරිදි පිළියෙල කරන ලද තාවකාලික ලැයිස්තුව පිටපත් තුනකින් පිළියෙළ කොට, එක් පිටපතක් පාසැල් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශණය කළ යුතු අතර, එක් පිටපත පළාත් අධ්‍යක්ෂවරයා වෙත යැවිය යුතුය. (ජාතික පාසලක් නම් මෙම අමාත්‍යාංශයේ ජාතික පාසල් අංශය වෙත) තුන්වන පිටපත ගොනුවේ ගොනු කිරීම ද කළ යුතුය.

දැන්වීම් පුවරුවේ යොදන පිටපත එහි සති දෙකක්වත් අඛණ්ඩව ප්‍රදර්ශණය කළ යුතුය.

(ඊ) තෝරාගත් අයට ලිඛිතව විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව සහිතව (උප ලේඛන අංක 2 ආකෘතිය අනුව) දැනුම් දිය යුතු අතර, තෝරා නොගත් අයට ළමයා අයත් ගණය ද සඳහන් කොට තෝරා නොගැනීමට හේතු ද පැහැදිලිව සඳහන් කොට ලිඛිතව දන්වා යැවිය යුතුය. ළමුන් තෝරා ගැනීමේ, ඒ ඒ ගණයට සීමා වූ අවම දුර ප්‍රමාණය ද එක වශයෙන් අනිවාර්යෙන් ම මෙම ලිපියේ සඳහන් කළ යුතුය. මේ සඳහා මෙම චක්‍රලේඛයේ උපලේඛණයේ දැක්වෙන අංක 03 දරන ආකෘතිය භාවිතා කළ යුතුය.

(උ) පැමිණ සිටින අයගෙන් යම්කිසි විරුද්ධතාවයක් පැන නැගුන හොත් ඒවා වාර්තා කරගත යුතු අතර, වැරදි සහගතව කරනු ලබන තෝරා ගැනීම් වලට විරුද්ධව විනයානුකූල ක්‍රියා කිරීමට ඉඩ තිබේ.

(ඌ) වයස අවුරුදු හය හෝ ඊට වැඩි ළමුන්ගේ අයදුම්පත් එක එල්ලේම අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

## 9 අභියාචනා

9.1 ඇතුළත් කිරීමේ මූලික සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තෝරා නොගන්නා ලද, ළමයෙකුගේ මා පිය කෙනෙකු විසින් පාසැල් පුවරුවේ ප්‍රදර්ශණය තර ඇති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් හෝ තාවකාලික ලැයිස්තුව ප්‍රදර්ශනය කළ දින සිට සති දෙකක් ඇතුළත ලැයිස්තුවේ දැක්වෙන නම් ඇති යම් ළමයෙකුට වඩා, තමාගේ ළමයා පාසලට ඇතුළත් කිරීමට හිමිකම් ඇතැයි යන හේතුව මත හෝ ඒ ලැයිස්තුවේ දැක්වෙන නම් ඇති ළමුන් තේරීම පිළිබඳ යම් අනුමානිත හේතුවක් මත හෝ පාසැල් ප්‍රධානියා වෙත ලියවිල්ලක් මගින් අභියාචනා කරනු ලැබිය හැකිය.

9.2 (අ) පාසල් ප්‍රධානියා විසින් ඒ සියළු අභියාචනා උපලේඛන ගත කර මේ වගන්තියට පෙරාතුව වූ විධි විධාන වල සඳහන් දෙසතියක කාල සීමාව ඉකුත්වීමෙන් එක් සතියක් ඇතුළත මේ අභියාචනා සංඛ්‍යාව පිළිබඳව පළාත් අධ්‍යක්ෂ වෙත දැනුම් දෙනු ලැබිය යුතුය. (ජාතික පාසලක් නොවන කල්හි, කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාපීය අධ්‍යාපන අධ්‍යක්ෂ විය යුතුය)

(ආ) උප ලේඛණ ගත ඉහත සඳහන් ලේඛණය අනුසාරයෙන්, මූලික සම්මුඛ පරීක්ෂණයට උපයෝගී කරගත් (සී. ආර්. පොත) ලේඛණයේ අදාල නම් යටින් විශේෂ පාටකින් ඉරක් ඇඳීමෙන් හෝ හයිලයිට් කිරීමෙන් හෝ අභියාචනාවට ලක්වන බැව් දැක්විය යුතුය.

## 9.3 අභියාචනා මණ්ඩල

(අ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා (ජාතික පාසලක් නොවන කල්හි කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ) විසින් ඒ අභියාචනා සලකා බලා තීරණයක් ගැනීම සඳහා අභියාචනා මණ්ඩල පත් කරනු ලැබිය යුතුය. එම අභියාචනා මණ්ඩලය පළාත් අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නියෝජිතයෙක් ජාතික පාසල් නොවන කල්හි කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනත් දෙපාර්තමේන්තුවක නිලධාරියෙක්, වෙනත් පාසලක ප්‍රධානියෙක් යන තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(ආ) යම් ජාතික පාසලක් සඳහා මෙම අභියාචනා මණ්ඩලය පාසලට පරිබාහිරව පුද්ගලයන්ගෙන් යුක්ත විය යුතු යයි මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් කරන්නේ නම් එසේ පත් කිරීමේ බලය ඔහුට ඇත්තේය.

(ඇ) අභියාචනාවේදී ඉදිරිපත් කර ඇති ලිපි ලේඛණ නැවත වරක් විමර්ශනය කිරීමේදී මූලික පරීක්ෂණයේදී ඇති '√' ලකුණ x රතුපාටින් කපා හැර විමර්ශණයට ලක් කළ බව තහවුරු කළ යුතුය. යම් දෝෂයක් හමු වුවහොත් විශේෂ සටහන් තීරුවෙන් එය රතුපාටින් ලියා දක්විය යුතුය.

(ඈ) අභියාචනාවේදී ඉදිරිපත් කළ හැක්කේ මූලික පරීක්ෂණයේදී ඉදිරිපත් කළ ලිපි ලේඛණ පමණී. එයට අතිරේක ලේඛණයක් ඉදිරිපත් කරන්නේ නම්, එසේ පසුව ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු පැහැදිලි කළ යුතුය. අභියාචනාවයෙන් බලාපොරොත්තු වන්නේ එම ගණයට අයත් වෙනත් අපේක්ෂකයෙකුට නොවූ අසාධාරණයක් හෝ ප්‍රමාද දෝෂයක් අභියාචකයාට වී ඇතිනම් නිවැරදි කිරීම බව සැලකිය යුතුය.

(ඉ) අභියාචනා මණ්ඩලයේ රැස්වීම් කටයුතු ප්‍රසිද්ධියේ පැවැත්විය යුතුය.

(ඊ) කුමන තත්ත්වයක් යටතේ වුවද,, අභියාචනා මණ්ඩලය සඳහා කැඳවීම් හා සංවිධාන කටයුතු පාසල් ප්‍රධානියා විසින් කළ යුතු වන්නේය.

10 (අ) 9.3 (අ)යටතේ අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කරන ලද සියළු අභියාචනා පිළිබඳ තීරණ එයට හේතු ද සමග අභියාචනා විභාග කර සතියක් ඇතුළත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට/කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට පිටපතක් සහිතව ප්‍රකාශයට පත් කළ යුතුය.

(ආ) අභියාචනයෙන් ඇතුළත් කිරීම සඳහා සුදුසු යැයි තීරණය කරන ලද ලේඛණයට අමතරව ප්‍රමුඛතා පිළිබඳව තෝරා ගන්නා ලද (ඒ ඒ ගණය යටතේ) ළමුන්ගේ නම් පහළොවකින් යුතු පොරොත්තු ලේඛණයක් පිළියෙළ කළ යුතුය. එහි පිටපතක් ද ඉහත සඳහන් නිලධාරියාට යැවිය යුතුය.

(ඇ) අභියාචනා මණ්ඩලයයේ තීරණය කුමක් වුවද තීරණය කර සතියක් ඇතුළත අභියාචකන්ට පාසල් ප්‍රධානියාගේ පුද්ගලික අත්සනින් හා නිල මුද්‍රාවෙන් යුතුව ලිඛිතව දැනුම් දිය යුතුය.

අභියාචනාය ප්‍රතික්ෂේප කිරීමට හේතුව පැහැදිලිව සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ඈ) අභියාචනාවේදී ඉදිරිපත් කරන ලද ලේඛන වල ඡායාස්ථ පිටපත් ඇතුළත් ගොනුවක් අනිවාර්යයෙන්ම (ඒ ඒ ළමයාට වෙන් වශයෙන්) තබා ගත යුතුය.

(ඉ) අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳ අභියාචනා මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

(ඊ) එසේ වුවද යම් බලවත් අසාධාරණයක් සිදු වී ඇතැයි යම් අයදුම්කරුවකුට කරුණු සහිතව සනාථ කළ හැකි නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත (ජාතික පාසලක් නම් මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත) අභියාචනා කළ හැකිය.

11 (අ) අභියාචනා සළකා බැලීමෙන් පසු ව ඇතිවන පුරප්පාඩු කිසිවක් වෙතොත් ප්‍රමුඛතා පිළිවෙලට අනුව පොරොත්තු ලේඛණයේ දැක්වෙන නම් ඇති ළමුන් අතුරින් පුරවනු ලැබිය යුතුය.

(ආ) ඉනික්බිති තවදුරටත් පුරප්පාඩු වෙතොත් කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට (ජාතික පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට) පාසල් ප්‍රධානියා විසින් දැනුම් දෙනු ලැබිය යුතුය.

12 තෝරා නොගත් ළමුන්ට පාසල් ලබාදීම

(අ) පාසලකට, තෝරා නොගත් යම් ළමයෙකුගේ මා පිය කෙනෙක් විසින් තමන්ගේ දරුවාට විකල්ප පාසලක් ලබාගැනීම සඳහා තමන් පදිංචි කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත, නව ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ආ) තෝරා නොගත් ළමුන් පිළිබඳ වාර්තාවක් පාසල් ප්‍රධානියා විසින් කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඔවුන්ට විකල්ප පාසලක් ලබාදීමට කටයුතු කළ යුතුය.

(ඇ) පළමු වසර සිසුන් ඇතුළත් කිරීම් ජනවාරි 15 වන දිනට අවසන් කළ යුතුය. ඒ දිනය වන විට ඇතුළත් කරන ලද ළමුන්ගේ නාම ලේඛණයක් කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත (ජාතික පාසලක් නම්, මෙම අමාත්‍යාංශයේ ජාතික පාසල් අංශය) වෙත අප්‍රමාදව එවිය යුතුය.

13 දෙවන වසරේ සිට 11 වසර දක්වා (6 වසර හැර) පංතිවලට ළමුන් ඇතුළත් කිරීම

2 වන වසරේ සිට 11 වසර දක්වා (6 වසර හැර) පන්තිවල පුරප්පාඩු පහත දක්වෙන සිසුන් වර්ග අතරින් පුරවනු ලැබිය යුතුය.

(අ) ස්ථාන මාරුවන් ලැබ, ඒ පාසැල පිහිටි ප්‍රදේශයේ වාසයට පැමිණි රජයේ නිලධරයන් වන මාපියන් ඇති සිසුන්,

(ආ) ඒ පාසල පිහිටි ප්‍රදේශයට සැබැවින්ම තම ස්ථිර වාසස්ථානය වෙනස් කර පැමිණි මාපියන් ඇති සිසුන්,

(ඇ) ඒ පාසැල පිහිටි ප්‍රදේශයට විදේශගතව සිට ආපසු පැමිණ ස්ථිර වාසස්ථාන එහි පිහිටුවා ගත් මාපියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන් ඇති සිසුන්.

14. හයවන වසටර ළමුන් ඇතුළත් කිරීම

(අ) පස්වන වසර ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල, එකී ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කිරීමෙන් පසුව හා නම් කරන ලද පෝෂිත පාසල්වල ළමුන් ඇතුළත් කිරීමෙන් පසුව, 6 වන වසර පන්තිවල තවදුරටත් අබැර්තු තිබේනම්, එකී ඇබැර්තු පිරවීම සඳහා පාසල් මට්ටමේ විභාගයක් පැවැත්වීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ (ජාතික පාසලක් නම් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් මෙම අමාත්‍යාංශයේ) අනුමැතිය ලබා ගත යුතුය.

(ආ) ප්‍රාථමික අංශය නොමැති නම් කරන ලද පෝෂිත පාසල් නොමැති පාසල් වන කල්හි,

"පාසල්වල පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේදී" ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දරුවන් හා දැනට අධ්‍යාපනය ලබන දරුවන්ගේ සහෝදර/සහෝදරියන්ට දී ඇති අනුග්‍රහය, කණ්ඩායම් දෙකට ම 20% ක් වනසේ ලබා දිය යුතුය. මේ සඳහා ඉහත 'අ' ඡේදයේ සඳහන් පරිදි පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

15. 5 වසර දක්වා පමණක් පන්ති ඇති පාසල්වල, 5 වන වසර සම්පූර්ණ කරන සියළුම සිසුන්ට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා/කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් විකල්ප පාසල් ලබා දිය යුතුය.

16. විධිමත් අධ්‍යාපනයක් නොලද, වයස වැඩි ළමුන් පාසල්වලට ඇතුළත් කිරීම

විධිමත් පාසැලකට නොගිය සිසුන් ප. අ. අ. ගේ අවසරය ලබාගෙන ඔවුන්ගේ වයස, වැඩීම හා ප්‍රවීණත්වය අනුව ගැලපෙන පංතියකට ඇතුළත් කළ හැකිය.

17. අ. පො. ස (උ.පෙ) (12 වසර) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම

17.1 සාමාන්‍ය සුදුසුකම්

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ) විභාගයේදී මාධ්‍ය භාෂා හා ගණිතය ඇතුළු විෂයයන් 6 කින් සමන්විත යුතු අතර, ඉන් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතුය. මෙම සුදුසුකම් වරකදී හෝ දෙවරකදී ලබා ගත හැකිය. දෙවරක දී මෙම සුදුසුකම් ලබා ඇති ශිෂ්‍යයෙකු, ඉන් එක් වරක දී මාධ්‍ය භාෂාව හෝ ගණිතය ඇතුළුව සම්මාන තුනක් සහිතව විෂයයන් 5 කින් සමත් වී සිටිය යුතුය.

(ආ) සම්මාන සාමාර්ථ තුනක් සහිතව මාධ්‍ය භාෂාව, හා ගණිතය ඇතුළුව විෂයයන් පහකින් සමන්විත ශිෂ්‍යයෙකු අනතුරුව පැවැත්වෙන අ.පො.ස. (සා.පෙ) විභාගයේදී ම නියමිත සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමේ කොන්දේසිය මත තාවකාලික අ. පො. ස. (උ.පෙළ) පන්තියට ඇතුළත් කර ගත හැකිය. එසේ ඇතුළත් කරගනු ලබන ශිෂ්‍යයෙකු මෙහි සඳහන් කර ඇති සුදුසුකම් ලබා නොගතහොත් පාසලෙන් අස්විය යුතුය.

17.2 අ.පො:ස (උ.පෙ) විෂය ධාරාවන්ට ඇතුළත්වීම සඳහා අවශ්‍ය විශේෂ සුදුසුකම්

ඉහත සඳහන් සුදුසුකම් වලට අතිරේකව ඒ ඒ විෂය ධාරාවන්ට ඇතුළුවීම සඳහා පහත එන අනුච්ඡේදයන්හි දක්වා ඇති විශේෂ සුදුසුකම් ද, එකම විභාගයේදී ලබා තිබිය යුතුය.

(අ) කලා විෂය ධාරාව

"අ" උපඡේදයේ සඳහන් කර ඇති සම්මාන සාමාර්ථ තුන අතුරෙන් යටත් පිරිසෙයින් එකක්වත් අ.පො.ස (උ.පෙ.) විභාගය සඳහා තෝරා ගන්නා විෂයයක් විය යුතුය. ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාවේ මූලධර්ම, ඉතිහාසය, භූගෝල විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, සමාජ විද්‍යාවේ හා මනෝ විද්‍යාවේ මූලධර්ම යන කවර හෝ විෂයක් හැදෑරීම සඳහා අවශ්‍ය සම්මාන සමාර්ථය අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී සමාජ අධ්‍යයනය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා ගැනීමෙන් සපුරාලිය හැකිය.

(ආ) වාණිජ විද්‍යා විෂය ධාරාව

නියමිත සම්මාන සාමාර්ථ තුනෙන් එකක් වාණිජ විද්‍යාවට, ගණිතයට හෝ සමාජ අධ්‍යයනයට හෝ විය යුතුය.

(ඇ) සෞන්දර්ය විෂය ධාරාව

නියමිත සම්මාන සාමාර්ථ තුනෙන් එකක් චිත්‍ර කර්මයට හෝ සංගීතයට හෝ නැටුම් වලට හෝ වියයුතුය.

(ඇ) සිංහල, දෙමළ, ඉංග්‍රීසි හෝ බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, ක්‍රිස්තු ධර්මය (රෝ.ක.) ක්‍රිස්තු ධර්මය (රෝ.ක. නොවන) යන කවර හෝ විෂයයන් ඉහත සඳහන් විෂය ධාරාවන් යටතේ හැදෑරීමට බලාපොරොත්තු වන ශිෂ්‍යයකු අ.පො.ස. (සා.පෙ.) විභාගයේදී එම විෂයන් සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(ඉ) විද්‍යා විෂය ධාරාව

නියමිත සම්මාන සාමාර්ථ තුනෙන් එකක් විද්‍යාවට හෝ ගණිතයට හෝ තවද, විද්‍යාව හා ගණිතය යන විෂයයන් දෙකෙන්ම සමත් වී තිබිය යුතුය.

(ඊ) දොළොස්වන වසරට ඇතුළත් වීමෙන් පසුව තමන් තෝරා ගත් විෂය ධාරාව කිරීමට ඉල්ලා සිටින ශිෂ්‍යයෙකුට එම වර්ෂය තුළ දී අවශ්‍ය සුදුසුකම් තිබේ කිරීමට ඉඩ දිය හැකිය. මෙසේ ඉඩ දෙනු ලබන්නේ අ.පො.ස. (උ.පෙ.) පන්තියට සිටීමට උපරිම වශයෙන් ශිෂ්‍යයෙකුට ලැබෙන කාලසීමාව වර්ෂ තුනක් කොන්දේසිය මතය. අනතුරුව පැවැත්වූ අ.පො.ස. (සා.පෙ.) විභාගයක ප්‍රතිඵල විෂය ධාරාව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(උ) ඉහත දක්වා ඇති සුදුසුකම් නියමකර ඇත්තේ අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට ඇතුළත් කිරීම සඳහා පමණක් බව පාසල් ප්‍රධානීන් මතක තබා ගත යුතුය. විශ්ව ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින්, විශ්ව විද්‍යාලයන්හි විවිධ අධ්‍යාපන පීඨයන්ට ඇතුළුවීම සඳහා නියම කර ඇති අවශ්‍යතා සළකා බලා සිය ශිෂ්‍යයන්ට උපදෙස් දීම පාසල් ප්‍රධානීන්ගේ වගකීම වේ.

18 අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීමේ ප්‍රමුඛතාව

අ.පො.ස. (උ.පෙ.) පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම සඳහා තෝරා ගැනීමේ ප්‍රමුඛතාවය පහත දක්වෙන අයුරුවේ.

(අ) එම පාසලේ ඉගෙනුම ලබන සිසුන්,

(ආ) අ.පො.ස. (උ.පෙ.) පන්ති නොමැති පාසල් වලින් හෝ අදාළ විෂය ධාරාව නොමැති පාසල්වලින් පැමිණෙන සිසුන්,

(ඇ) උසස් පෙළ පන්තියට ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇති මැයි මස 1 වැනි දිනට වයස අවුරුදු 18 ට අඩු වෙනත් සිසුන්,

(ඈ) ඉහත (ආ) හා (ඇ) යටතේ අ.පො.ස. (උ.පෙ.) පන්තියට ඇතුළත්වීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම අයදුම්පත් ලේඛනගත කොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමත ලකුණු දීමේ ක්‍රමයක් යටතේ තෝරා ගැනීම කළ යුතුය. ලකුණු දීමේ ක්‍රමය අ.පො.ස. (සා.පෙ.) ප්‍රතිඵල හා විෂයානුබද්ධ ක්‍රියාකාරකම් පදනම් කරගෙන සකස් කර ගත යුතුය.

(ඉ) අ.පො.ස.(උ.පෙ) පන්ති නොමැති පාසල්වලින් සුදුසුකම් ලත් සියළුම සිසුන්ට අ.පො.ස. (උ.පෙ.) පන්ති ඇති පාසල්වලට ඇතුළුවීමට ඉඩ සලසාදීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ වගකීම වේ.

19 අ.පො.ස. (උ.පෙ.) පනතිවල අධ්‍යයනය කළ හැකි කාලසීමාව

(අ) අ.පො.ස. (උ.පෙ.) පාඨමාලාව 12 වන වසර සහ 13 වසර යනුවෙන් දෑ අවුරුදු කාලසීමාවකට සාමාන්‍යයෙන් සීමාවේ.

(ආ) ශිෂ්‍යයෙකු 12 වන වසර සම්පූර්ණ කළවිට 13 වසරට උසස් කළ යුතුවේ.

(ඇ) දහතුන්වන වසරේ සෑම ශිෂ්‍යයෙකුම එම වසර අවසානයේදී නියම කර ඇති මූලික

අවශ්‍යතා සපුරා ඇත්නම් අ.පො.ස. (උ.පෙ.) විභාගයට ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ශිෂ්‍යයෙකු තමා විශ්ව විද්‍යාලයේදී හැදෑරීමට බලාපොරොත්තුවන පාඨමාලාව සඳහා තෝරා නොගතහොත් දහතුන්වන වසරේ පාඨමාලාව නැවත එක්වරක් පමණක් හැදෑරීමට අවසර දිය හැකිය.

20 පොදු කරුණු

(අ) පිළිගත හැකි හේතුවක් නොමැතිව ජාතික පාසලකින්, ජාතික පාසලකට ළමුන් ඇතුළත් නොකළ යුතුය. එවැනි අවස්ථාවල මෙම අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාවට ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගත යුතුය.

(ආ) සාමාන්‍යයෙන් පංතියක සිසුන් සංඛ්‍යාව අවසරයක් නොමැතිව 45 නොඉක්මවිය යුතුය.

(ඇ) විදේශගතව සිට පැමිණෙන ළමයෙකු ඒ රටේ අධ්‍යාපනය ලැබූ පන්තිය හෝ ශ්‍රේණිය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ පන්ති (ශ්‍රේණි) ක්‍රමයට සමාන්තර නොවන විට ඒ ළමයාගේ වයස් සීමාවත්, ප්‍රවීණතාවයන් සළකා සුදුසු පංතියකට ඇතුළත් කළ හැකිය.

(ඇ) ත්‍රස්තවාදී ක්‍රියා හේත කොට ගෙන විතැන් වූ - පවුල් දරුවන් පාසල් වලට ඇතුළත් කිරීමේදී උප්පැන්න සහතික, අස්වීමේ සහතික ආදිය ද නොමැති වූ විට, එකී පවුල් ත්‍රස්තවාදී ක්‍රියාවලට භාජනය වූ බවට ග්‍රාමසේවක සහතිකය, අනාථ කඳවුරු සහතිකය ආදිය සළකා බලා සුදුසු පරිදි ඇතුළු කර ගැනීමට කටයුතු කළ යුතුය.

(ඉ) විධිමත් පාසල් වලට ඇතුළත් නොවූ එහෙත් නොවිධිමත් අධ්‍යාපන වැඩ සටහන යටතේ සාක්ෂරතා පන්තිවලට සහභාගි වී සාක්ෂරතා කුසලතා ලැබූ ළමුන් ඔවුන්ගේ වයස සාක්ෂරතා ප්‍රවීණතාවය සළකා සුදුසු පන්තිවලට ඇතුළත් කර ගැනීමට හැකිය.

(ඊ) රජයට පවරා ගන්නා ලද පාසල් වල පුරප්පාඩු පිරවීමේදී පවරා ගන්නා අවස්ථාවේ තත් පාසලේ සිටි ආගමික සිසු අනුපාතය ගැන සැලකිලිමත් විය යුතුය. යම් ආගමන එක් කොටසකට වෙන් කරන ලද ප්‍රමාණයට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇති කල්හි එම පුරප්පාඩු සෙසු ආගමික කොටස් අතර, අනුපාතිකව බෙදා හැරිය යුතුය.

21 ළමුන් ඇතුළත් කිරීම සඳහා මුදල් ආධාර ලබාගැනීම තහනම් කිරීම

සියළුම රජයේ ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමේදී පහසුකම් හා සේවා ගාස්තු පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල හැර වෙනත් ගාස්තු හෝ ආධාර මුදල් හෝ වෙනයම් බදු බාහිරාදියක් හෝ අය කිරීම්/ලබාගැනීම සම්පූර්ණයෙන් ම තහනම් වේ.

එම්. ඩී. ඩී. පීරිස්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත්

1 අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම ශාඛා ප්‍රධානීන්,
2 ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
3 අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්
4 විභාග කොමසාරිස් ජනරාල්

## අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

| | | |
|---|---|---|
| 1 | ගෘහ මූලික | :................................................................................ |
| 2 | ආදි ශිෂ්‍ය | :................................................................................ |
| 3 | දනට දරුවන් එවන මාපියන්ගේ දරුවන් | :................................................ |
| 4 | ස්ථාන මාරු ලැබූ නිලධාරීන්ගේ දරුවන් හා වෙනත් | :.............................. |
| 5 | ගෘහ මූලික නොවන | :................................................................................ |

**1996 වර්ෂයේදී ................................................ පාසලේ පළමු වසර**
**පන්තියට ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය**

1.0 ළමයා පිළිබඳ විස්තර

1.1 සම්පූර්ණ නම :..........................................................................
(වාසගමට යටින් ඉරක් අඳින්න)
1.2 ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................
1.3 අධ්‍යාපන මාධ්‍යය :..........................................................................
1.4 උපන් දිනය :..........................................................................
1.5 1996 ජනවාරි 31 දිනට වයස අවුරුදු :..............................................
අවුරුදු............ මාස............. දින..................

2.0 දෙමාපියන් පිළිබඳ විස්තර

මව/පියා/නීත්‍යානුකූල භාරකරු
2.1 සම්පූර්ණ නම :..........................................................................
2.2 පුරවැසි භාවය :..........................................................................
2.3 ආගම :..........................................................................
2.4 ස්ථිර ලිපිනය :..........................................................................
නිවාස අංකය :..........................................................................
පාර :..........................................................................
නගරය :..........................................................................
2.5 ග්‍රාම නිලධාරී කොට්ඨාශය :..............................................................

2.6 ඔබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සන්නද්ධ හමුදාවන්හි හෝ ශ්‍රී ලංකා පොලිස් සේවයේ හෝ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියෙහි නියුක්ත වී සිටින්නේද?..........................................................................................
(එසේ නම් ඒ බවට සනාථ කෙරෙන ඔබගේ ආසන්නතම ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයේ ඡායාස්ථ පිටපතක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කරන්න.)

3.0 පදිංචිය පිළිබඳ විස්තර

3.1 දෙමාපියන්ගේ/නත්‍යානුකූල භාරකරුවන්ගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට පාසල දක්වා ඇති කෙටිම දුර (ලිපිනය සඳහන් කරන්න) :..............................................
3.2 ඉහත ලිපිනයෙහි පදිංචිය ආරම්භ කළ දිනය :..............................................

3.3 ඉහත 3.1 යටතේ සඳහන් පදිංචි ස්ථානයට ප්‍රථමයෙන් පදිංචිව සිටි ස්ථානයේ ලිපිනය :...........................................................................................

3.4 අයදුම්කරු ප්‍රධාන ගෘහමූලිකයා ද යන වග :..............................................

3.5 අයදුම්කරු ප්‍රධාන ගෘහමූලිකයා නොවේ නම්, ගෘහමූලිකයාට ඇති නෑ සබඳකම: ...........................................................................................................

3.6 ගෘහමූලිකයා තම පියා හෝ මව හෝ නම් ඔවුන් සමග එකම නිවසේ පදිංචි බවට ඇති සාක්ෂි :...........................................................................................

4.0 පාසල සමග ඇති සම්බන්ධතා

4.1 අයදුම්කරු සහ / හෝ කලත්‍රයා මෙම පාසලේ ආදි ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක් වේද යන්න ද සහ එසේ නම් එම පාසලෙහි ඉගෙනීම කළ කාල සීමාව :......................................

4.2 අයදුම්කරුගේ ළමයකු/ළමයින් මෙම පාසලෙහි ඉගෙනීම ලබමින් සිටින්නේ ද යන්න සහ එසේ නම් ඔහුගේ/ඔවුන්ගේ නම/නම් සහ ඉගෙනීම ලබන වසර/වසරවල් සඳහන් කරන්න: ...........................................................................................

5.0 අනිකුත් අදාල තොරතුරු

5.1 පාසල් සහ අනිකුත් ළමයින් පිළිබඳ විස්තර :- ඔවුන්ගේ නම්, ඔවුන් ඉගෙන ගන්නා පාසල් සහ වසරවල් සඳහන් කරන්න. :...........................................................................

5.2 වෙනත් අදාල විස්තර :...........................................................................................

6.0 ප්‍රකාශය

මගේ ළමයා ඉගෙනීම පිණිස යම්කිසි රජයේ පෞද්ගලික හෝ අනුමත හෝ පාසැලකට දනට නොයන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි. තවද, මෙහි ඉහතින් සඳහන් කරනු ලැබූ තොරතුරු සත්‍ය බවත්, මවිසින් මෙහි සඳහන් කළ ස්ථිර පදිංචිය පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කිරීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරුක් අසත්‍ය බව හෙළි වුවහොත් මගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි.

ඔහු/ඇය පාසලෙන් ඉවත් කොට ගෙන දෙපාර්තමේන්තුව විසින් නම් කෙරෙන ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

...........................................................................................

මවගේ/පියාගේ/නීත්‍යානුකූල භාරකරුගේ අත්සන

## ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දරුවන් තෝරා ගැනීමේ නිර්නායක හා ලකුණු ක්‍රමය

| | | |
|---|---|---|
| 1 | ශිෂ්‍ය ජීවිතයේදී එම පාසැලේ ගත කළ කාලය (අවුරුද්දකට) | ලකුණු 01 බැගින් |
| 2 | ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකත්වයට | ලකුණු 01 යි |
| 3 | ආදි ශිෂ්‍ය සංගමයේ යාවජීව සාමාජිකත්වයට | ලකුණු 02 යි |
| 4 | ආදි ශිෂ්‍ය සංගමයේ දරු නිලතලවලට | ලකුණු 01 යි |
| 5 | පාසල් ජීවිතයේ දී ශිෂ්‍ය නායකයෙක් වී නම් | |
| | ප්‍රධාන ශිෂ්‍ය නායක/නායිකා | ලකුණු 03 යි |
| | ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක/නායිකා | ලකුණු 02 යි |
| | කණිෂ්ඨ ශිෂ්‍ය නායක/නායිකා | ලකුණු 01 යි |
| 6 | ක්‍රීඩා නායකත්වයට | ලකුණු 02 යි |
| 7 | ශිෂ්‍ය භට/පොලිස් භට කණ්ඩාමේ නායක/නායිකා | ලකුණු 03 යි |
| 8 | ශිෂ්‍ය භට/පොලිස් කණ්ඩායමේ සාමාජිකත්වයට | ලකුණු 02 යි |
| | බාල දක්ෂ/දක්ෂිකා කණ්ඩායමේ නායක/නායිකා | ලකුණු 02 යි |
| | බාල දක්ෂ/දක්ෂිකා කණ්ඩායම් සාමාජිකත්වයට | ලකුණු 01 යි |
| 9 | අන්තර් පාසල් තරඟ වලින් ජය ලැබූ | |
| | (විෂය සමාගම් හා විෂය බාහිර) | |
| | 1 ස්ථානය | ලකුණු 03 යි |
| | 2 ස්ථානය | ලකුණු 02 යි |
| | 3 ස්ථානය | ලකුණු 01 යි |
| | රන් පදක්කම | ලකුණු 03 යි |
| | රිදී පදක්කම | ලකුණු 02 යි |
| | ලෝහ පදක්කම | ලකුණු 01 යි |
| 10 | ශිෂ්‍ය සංගමයක දරු තිලයකට | ලකුණු 01 බැගින් |
| 11 | අ.පො.ස (සා.පෙ.) සමත් නම් | ලකුණු 02 යි |
| | අ.පො.ස (උ.පෙ.) සමත් නම් | ලකුණු 03 යි |
| | විශ්ව විද්‍යාලයට ඇතුලත් වී නම් | ලකුණු 02 යි |
| | පිළිගත් ශිෂ්‍යත්වයකින් දිනුවේ නම් | ලකුණු 02 යි |
| 12 | ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ, පියාද/මවද ආදි ශිෂ්‍යයෙක් ශිෂ්‍යාවක් නම් | ලකුණු 02 යි |
| | ආදි ශිෂ්‍ය පරම්පරාවේ කලින් අය ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවක් නම් | ලකුණු 02 යි |
| 13 | ආදි ශිෂ්‍ය/ශිෂ්‍යා එම පාසලේම ස්ථිර සේවයේ යෙදේ නම් | ලකුණු 02 යි |
| 14 | පාසැලේ දියුණුව සඳහා දෙන ලද විවිධ ආකාරයේ සහයෝගය | ලකුණු 03 යි |

සැ.යු. -

මීට අමතරව (අවශ්‍ය නම්) විවිධ විෂය සමාගම් හා විෂය බාහිර ක්‍රියාකාරකම් රාශියක් ඇති විදුහලකට ඒ අනුව සැලැස්මක් පිළියෙල කර ගත හැකිය. කෙසේ වුවද, සැලැස්මක් ප්‍රසිද්ධියේ භාවිතා කොට තෝරා ගැනීම සාධාරණව සිදු වූ බව පෙනෙන්නට ද තිබිය යුතුය.

## ඇතුළත් කිරීම සඳහා තෝරාගත් ළමුන්ගේ මා පිය භාරකරුවන්ට යවන ලිපියේ ආකෘතිය

විදුහල :..................................................

ලිපිනය :..................................................

දිනය :..................................................

..................................................මයා/මිය,

..................................................

..................................................

### පළමු වන වසරට ළමුන් ඇතුළත් කිරීම 199........

ශිෂ්‍යයා/ශිෂ්‍යාව අයත් ගණය :..................................................

එම ගණයට තීරණය වූ උපරිම දුර :........................................

ඔබේ දරුවා වන.................................................................. ළමයා මෙම විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කිරීම සඳහා තාවකාලිකව තෝරා ගෙන ඇති බව සතුටින් දන්වා සිටිමි.

එසේ වුවද, තෝරා ගැනීම පිළිබඳ යම් කිසි අක්‍රමිකතාවයක් සිදු කර ඇතැයි සනාථ වුවහොත් මේ තෝරා ගැනීම අවලංගු විය හැකි බව සැලකිය යුතුය.

විදුහල්පති

නිල මුද්‍රාව

## ප්‍රතික්ෂේප වූ බව දන්වන ලිපියේ ආකෘතිය

විදුහල :.....................................................
ලිපිනය :.....................................................
දිනය :.....................................................

..............................................මයා/මිය,
..............................................
..............................................

## පළමු වන වසරට ළමුන් ඇතුළත් කිරීම 199........

1 ළමයා අයත් ගණය :..........................................................................
2 එම ගණය යටතේ ඇතුළත් කිරීමට තීරණය වූ උපරිම දුර :..............................

පහත සඳහන් හේතුන් නිසා ඔබේ දරුවා වන.................... ළමයා ඇතුළත් කර ගැනීමට නො නැති බව කණගාටුවෙන් දන්වමි.

1 අදාල ගනයට අයත් දුර ප්‍රමාණයට වඩා ඈතින් සිටීම.
2 පදිංචිය සනාථ කිරීමට ඉදිරිපත් කරනු ලැබූ ලිපි ලේඛණන ප්‍රමාණවත් නොවීම.
3 ලේඛන වලින් අවුරුදු තුනක අඛණ්ඩ පදිංචිය ඔප්පු කිරීමට අපොහොසත් වීම.
4 ඉදිරිපත් කරන ලද ලේඛන අසම්පූර්ණ වීම.
5 ආදි ශිෂ්‍යයෙක්/ශිෂ්‍යාවක් වශයෙන් ලැබූ ලකුණු ප්‍රමාණවත් නොවීම.
6
7

වෙනත් පාසලක් ලබා ගැනීම සඳහා ........................................ කලාපයේ/කොට්ඨාශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්‍ෂ වෙත අලුත් අයදුම්පතක් ඉදිරිපත් කරන්න.

එම ලිපිනය : .......................................................
.......................................................
.......................................................

විදුහල්පති

නිලමුද්‍රාව

*අනවශ්‍ය වාක්‍ය කොටස් කපා හරින්න